# විනයපිටකය

මොල්ලිගොඩ ප්‍රවචනොදය පිරිවෙන්හි උපප්‍රධානාචාර්ය ත්‍රිපිටක වාගීශ්වර
**පණ්ඩිත ලබුගම ලංකානන්ද**
අනුනායක ස්ථවිරපාදයන් වහන්සේ විසිනි.

තුන් ලොවට ඇදුරු වූ අප සම්මා සම්බුද්‍ධ රදුන් පස්මරුන් දිනා බුදු වැ දම්සක් පවත්වා ලූ තැන් පටන් සුභද්‍ර නම් පිරිවැජියා විනයනය කළ තැන් දක්වා මෙ දැතුරෙහි දෙශනා කළ නවාඞ්ගශාසනපය්‍ර්‍යාපන්න වූ යම් ධර්ම ස්කන්ධ කෙනෙක් ඇද්ද ඒ හැම 'ධර්ම-විනය' විසින් දෙ පරිදි වැ සිටියේ යැ. එහි: සත්වයන්ගේ චරිතාධිමුක්ති වශයෙන් කළ අනුශාසනා ඇති දිට්ඨී විනිවෙ-ය්ත කථා නම් වූ ව්‍යවහාර දෙශනා සංඛ්‍යාත සූත්‍රාන්ත පිටකය හා ඈත්මග්‍රාහ ඇති සත්වයනට යථා ධර්මයෙන් කළ අනුශාසනා ඇති නාම රූප කථා නම් වූ පරමාර්ථදෙශනා සංඛ්‍යාත අභිධර්ම පිටකය හා දෙ පිටකය ධම්ම ශබ්දයෙන් කියනු වෙයි. ව්‍යතික්‍රම දෙෂ බහුල සත්ත්වයනට අපරාධ වූ පරිදි කළ අනුශාසනා ඇති කුදු මහත් සංවරය ප්‍රකාශ කරන හෙයින් සංවරා සංවර කථා නම් වූ ආඥාදෙශනා සංඛ්‍යාත විනය පිටකය මැ 'විනය' නම් වේ.

විනය:

කුමක් හෙයින් විනය නම් වෙයි යත්; නිදනුද්දෙසාදි පස්වැදෑරුම් පාමොක් උදෙසීම් ඇති යෙනුදු, පාරාජික සංඝාදිසෙස-සාදි ආපත්ති ස්කන්ධ ඇති යෙනුදු, මාතිකා විභඞ්ග ඛන්ධක පරිවාර යන ප්‍රභෙද ඇති යෙනුදු විවිධනය ඇති හෙයින් ද ලොකවද්‍ය ශික්ෂා පදයෙහි දළ්හීකම්ම යැ ප්‍රඥප්තිවද්‍ය ශික්ෂාපදයෙහි සිථිලි කරණ යැ යන ප්‍රයොජන සංඛ්‍යාත විසෙසනය ඇති හෙයින් ද (විවිධ විසෙසනයත්තා) සංයම සීමාව මැඩැගෙන යන අධ්‍යාචාර යයි කියන ලද ශික්ෂාව්‍යති ක්‍රමය වළහා කායවාග්ද්වාර යන් විනයනය කරන හෙයින් ද (කාය වාචානං විනයනතො) භික්ෂු භික්ෂුණීන්ගේ සංයමය සඳහා බුදුරදුන් විසින් පනවා වදළ ශික්ෂාපද සමූහය 'විනය' නම් වෙයි. යළි සංගීති සමයෙහි උපාලි මහ තෙරණුවන් විසින් ''තෙන සමයෙන, තෙන ඛො පන සමයෙන, අථ ඛො, එවං වුත්තෙ, එතද-වොච'' යනාදි විසින් විනය පාළිය සම්බන්ධ කරනු සඳහා ඒ ඒ තන්හි ප්‍රකාශ කළ වචන ද, නිදන පුද්ගල වස්තු ආදිය හා උද්දන ගාථාදිය ද විනය පිටකයෙහි මැ ලා ගණනු ලැබෙයි. 'පිටක' නමුදු ''මා පිටක සම්පදානෙන'' යනාදි තන්හි සෙයින් පය්‍ර්‍යාප්ති අර්ථයෙනුදු ''අථ පුරිසො ආගච්ඡෙය්‍ය කුද්දල පිටකං ආදය'' යනාදි යෙහි සෙයින් ඒ ඒ අර්ථයට පාත්‍ර වැ සිටියේ නුයි ද 'පිටක' යයි කියනු ලැබේ. විනය මැ පිටක වූයේ නුයි 'විනය පිටක' නම් වී.

ප්‍රථම සංගීති අවස්ථායෙහි විනය පිටකය පාරාජික පාළි, පාචිත්තිය පාළි, මහාවග්ග පාළි, චුල්ලවග්ග පාළි, පරිවාර පාළි යයි ග්‍රන්ථ පසෙක සංග්‍රහ කොට සංගායනා කරන ලද්දේය. එ ද මාතිකා, විභඞ්ග, ඛන්ධක, පරිවාර, යන සතරෙහි සඞ්ගෘහීතෙ යැ. එහි 'මාතිකා' නම්: බුදුරදුන් විසින් ''යො පන භික්ඛූනං සික්ඛා සාජීවසමාපන්නො'' යනාදීන් ඒ ඒ අධ්‍යාචාරයෙහි-මෛථුන ධම්මාදි වස්තු ව්‍යතික්‍රමයෙහි පනවන ලද ශික්ෂාපද යැ. හෙ ද භික්ෂූන්ට පනවන ලද දෙසිය විස්සක් ශික්ෂාපද යැ. භික්ෂුණීන්ට පනවන ලද තුන්සිය සතරක් ශික්ෂා පද යැ යන මොහු සප්ත අධිකරණ සමථ ධර්මයන් සහිත

කොට 'උභය පාතිමොක්ඛ' යි සංග්‍රහ කරන ලදුයේ අඩ මසක් පාසා උදෙසීමට පැමිණියේ වෙයි. එය 'උභයමාතිකා, මාතිකා පාළි, නමිනුදු දන්නා ලැබේ. 'විභඞ්ග' ය මහා විභඞ්ග යැ, භික්ඛුණී විභඞ්ග, යැයි දෙ පරිදි වෙයි. එහි පාරාජිකකණ්ඩ, තෙරසකාදි කණ්ඩ ඇති භික්ෂූනට පනවන ලද දෙසිය විස්සක් ශික්ෂාපද ඇතුළු වැ සිටියෙ 'මහා විභඞ්ග' නම් වෙයි. එය 'භික්ඛු විභඞ්ග' යි ද පවසනු ලැබේ. භික්ෂුණීන් සඳහා පනවන ලද අටය පාරාජික, සත්තරස සඞ්ඝාදිසෙසාදි, තුන්සිය සතරක් ශික්ෂාපද ඇතුළු වැ සිටියේ 'භික්ඛුනී විභඞ්ග' නම මේ යැ, විභඞ්ග නම්. යට කී පරිජි, පචිති, දෙපොතෙහි ඇතුළු වැ සිටි 'උභතො විභඞ්ග' ය අෂ්ටාක්ෂරපාද ගාථා ගණනායෙන් සූසැට බණ වරක් පමණ වේ.

යළි බොධිකථායෙහි පටන් පබ්බජ්ජා උපසම්පද කර්මයන් පිළිබඳ විධානයන් වදළ මහාක්ඛන්ධකය ආදි කොට උපොසථ, වස්සූපනායික, පවාරණ, චම්ම, භෙසජ්ජ, කඨින චීවර, චම්පෙය්‍ය, කොසම්බිය යන දසඛන්ධකය හා 'තජ්ජනීය' ආදි කර්මයන් පනවා වදළ කම්මක්ඛන්ධක ය, පාරිවාසික, සමුච්චය, සමථ, ඛුද්දක වත්ථු, සෙනාසන, සඞ්ඝ භෙදක, වත්ත, පාතිමොක්ඛඨපන, භික්ඛුනික්ඛන්ධක, යන දස ඛන්ධකය හා පඨම මහා සඞ්ගීති කථා දක්වන පඤ්චසතිකක්ඛන්ධකය හා දුතිය සඞ්ගීති කථා දක්වන සත්තසතිකක්ඛන්ධකය හා දෙවිසි ඛන්ධකයෙන් යුත් යට කී මහ වග සුළු වග දෙපොත්හි බැස ගෙන සිටි අසූ බණ වරක් පමණ වූ පාළි ප්‍රදේශය 'ඛන්ධක' නම් වේ. මෙහි දු පඤ්ච සතික, සත්ත සතික, ඛන්ධක දෙක ද්විතීය තෘතීය සඞ්ගීති කාරක මහ රහතුන් විසින් සඟහාලූ බව ද සැලකිය යුතු ය. සුළුවග අවසානයෙහි සාහස්සිකක්ඛන්ධකයක් සංග්‍රහ නොවූයේ කවර හෙයිනු යත්; සාහස්සිකක්ඛන්ධකයක් සඟහාලන්නට නිසි සඞ්ඝ සන්නිපාතයක් නොවූ හෙයිනි.

උභතොවිභඞ්ග ඛන්ධක මාතිකා යන විනයාගත සියලු ප්‍රභෙද හුයෙකින් බැඳුණු මල්දමක් සෙයින් පරිවාර දෙශනායෙන් බැඳී පවත්නේ ය. (මාලාසුත්ත ගුණෙ තෙව පරිවාරෙන ගන්ථිතා) ඒ පරිවාරයා සොළොස් මහා වාරයෙකින් යුක්ත ය; එහි ''යං තෙන භගවතා අරහතා සම්මා සම්බුද්ධෙන පඨමං පාරාජිකං කත්ථ පඤ්ඤත්තං'' යනාදින් ආ 'කත්ථපඤ්ඤත්තිවාර'යැ යළි ''මෙථුනං ධම්මං පතිසෙවන්තො කති ආපත්තියො ආපජ්ජති'' යනාදි 'කතාපත්තිවාර'යැ. එසේ මැ 'විපත්තිවාර'යැ. 'සඞ්ගහවාරය'යැ, 'සමුට්ඨානවාර' යැ, 'අධිකරණවාර' යැ, සමථ වාර'යැ, 'සමුච්චයවාර' යැයි වාර අටක් වදරන ලද වෙයි. අනතුරුව ''මෙථුනං ධම්මං පතිසෙවනපච්චයා පාරාජිකං කත්ථ පඤ්ඤත්තං'' යනාදීන් ප්‍රත්‍යවශයෙන් ද යට කී 'කත්ථපඤ්ඤත්තිවාරාදි වාර අටක් දක්වන ලදි. මෙසේ මහාවිභඞ්ගයෙහි සොළොස් වාර කෙනෙක් වෙති. එපරිදි මැ භික්ඛුනී විභඞ්ගයෙහි ද මේ සොළොස් වාරයෝ ආවාහු වෙත්, අනතුරු ව සමුට්ඨාන සීස, අන්තරපෙය්‍යාල' ආදි අනෙකුදු දෙවිසි පරිච්ඡෙදයෙක් පරිවාරපාළියෙහි ආයේ වේ. මේ සියල්ල බණවර පස්විස්සක් පමණ වේ. සියලු විනයපිටකය අෂ්ටාක්ෂර පාද ගාථාගණනායෙන් එක්සිය එකුන්සැට (159) බණවරක් පමණ ඇතැයි දතයුතු ය.

විනය පිටකය වූ කලි බුද්ධකාලීන සමාජය පිළිබඳව ද බුද්ධශාසනයෙහි ක්‍රමානුකූල වර්ධනය පිළිබඳව ද කරුණු විමසනුවනට කැඩපතක් බඳු ග්‍රන්ථසමූහයෙකි. එසේ ම සැදැහැති කුල පුත්‍රයනට භවනිස්තරණය සඳහා පවත්නා උපාය මාර්ගයෙකි. එ හෙයින් අනවශ්‍ය විවෙචනයකට යොමු කිරීමෙන් පාඨකයන් විසංවාදනා කිරීමට අප මෙයින් අදහස් නොකරන බව ද පෙළ අටුවා ටීකා ඇසිරි කොට ඇඳුරු වදන්මඟ නො පියා මද කරුණක් මෙහි ලා ලියන බව ද සලකනු මැනැවි.

**ශාසනායුෂ:**

''විනයො නාම බුද්ධසාසනස්ස ආයු, විනයෙ ඨිතෙ සාසනං ඨිතං හොති'' යනු අටුවායෙහි වදළ හෙයින් බුද්ධශාසනයාගේ චිරජීවනයට බුදුසසුන් බොහෝ කල් පැවැත්මට විනය මුඛ්‍ය හෙතු වනබව ද, විනය ඇති කල්හි මැ සසුන් සිටුනාබව ද මෙනෙහි කළ යුතු ය. කොහි යැ, විනය සිටුනේ? සසුන් පිළිවෙත්හි හික්මෙනු කැමැති කුලපුත්‍රයන් කෙරෙහි ය. (සික්ඛා කාමෙසු ඨිතං) ශාසනාවචර කුලපුත්‍ර විනයෙහි සිටියැ යුතු ය, එකල්හි විනය ඔහු කෙරෙහි සිටියේ වනැ'යි කියේ යි. මෙසේ හෙයින් විනයප්‍රඥප්තියෙහි හික්මීම සාසනායු වැඩීමට කාරණ වනබව සසුන් වන් සැදැහැති කුලපුත්‍රයන් එක්වන් මෙනෙහි කළ යුතු ය.

අප බුදුන් බුදු වැ දෙළොස්වැනි හවුරුදුයෙහි වෙරඤ්ජා නුවර වස් එළැඹි සමයෙහි එනුවර හටගත් දුර්හික්ෂය නිසා හික්ෂූන් ප්‍රත්‍යයෙන් පීඩාවට පැමිණ සිටිය දී අගසවු සැරියුත් මහතෙරණුවෝ බුදුසසුන් බොහෝ කල් පවත්නා සඳහා හික්ෂූන්ට ශික්ෂාපද පනවාලුව මැනැවැ'යි අයැද සිටියහ. (වෙරඤ්ජා පුවත කියවන්න.)

**ශික්ෂා පැනැවීමෙහි කාලය:**

එසඳ බුදුහු ශික්ෂා පැනැවීමට තවම කාලය නො පැමිණියේ යයි ද, තථාගතයෝ මැ ශික්ෂා පැනැවීමෙහි නිසි කාලය දන්නාහ'යි ද වදළහ. හික්ෂුසඞ්ඝයා රාත්‍රඥ හාවයෙන් විපුලත්වයෙන් බහුශ්‍රැතහාවයෙන් හා ලාහයෙන් මහත්ත්වයට ගිය කල්හි සඞ්ඝයා කෙරෙහි දිට්ඨධම්මික, සම්පරායිකාදී ආස්‍රවයන් ඉපදීමට කාරණ වූ ධර්මයන් පහළ වෙති ද, එකල්හි තථාගතයෝ හික්ෂූන්ට ශික්ෂාපද පනවන්නාහ'යි ද වදළහ. දක්ෂ වූ ශල්‍යවෛද්‍යවරයෙක් මිනිසකුගේ කයෙහි මහත් වූ රොග නිදනයක් දැක ''පින්වත ඔබගේ කයෙහි මතු උපදනා ව්‍යසනදායී රොගයෙක ලකුණු ඇත, ඊට පිළියම් කෙරෙම් ද''යි පිළිවිත. රොගව්‍යසනයෙන් බියපත් ඔහුගේ පිළින යෙන් වෛද්‍යවරයා සැත්කමින් රොග නිදනය බැහැර කොට මිනිසා සුවපත් කෙරෙයි. එහෙත් නො පෙනෙන රොග යකට පිළියම් කළ වෛද්‍යවරයා පැසැ සුමට හෝ වැටුපට හිමි නො වෙයි. එ සෙයින් මැ නූපන් දෙෂයට සිකපද පනවන ශාස්තෲවරයා ලොකයා ගේ පැසැ සුම්ට හිමි නො වේ. එහෙයින් තථාගතයෝ සඞ්ඝයා කෙරෙහි ආසවට්ඨානීය ධර්‍මයන් උපන් කල්හි ඒ ඒ ව්‍යතික්‍රමදෙෂයන් ගේ ප්‍රතිෂෙධය සඳහා හික්ෂූන්ට ප්‍රඥප්ති ශික්ෂා පද පනවන සේක.

**ප්‍රථමබෝධියෙහි හික්ෂූහු:**

බුද්ධත්වයෙන් විසි හවුරුද්දක් පමණවූ කාලය ප්‍රථම බොධිය ලෙස සලකනු ලැබේ. ඒ ප්‍රථමබොධියෙහි හික්ෂූහු බුදුරදුන් ගේ චිත්තාරාධනය කළහ. එහෙයින් ඒ හික්ෂූන්ට ශික්ෂා පැනැවීමෙහි අවශ්‍යතාවයක් නො විය. ''ආරාධයිංසු වත මෙ හික්ඛවෙ හික්ඛූ එකං සමයං චිත්තං'' යනු කකචොපම සූත්‍රයෙහි වදළහ. එසෙ ම ''න මෙ හික්ඛවෙ තෙසු හික්ඛුසු අනුසාසනී කරණීයා අහොසි, සතුප්පාදකරණීය මෙව මෙ හික්ඛවෙ තෙසු හික්ඛුසු අහොසි'' යී බුදුරදුන්ට ඒ හික්ෂූන් කෙරෙහි නැවත නැවත කරුණු දක්වමින් අනුශාසනා කළ යුතු බවෙක් නො වීය. ඒ ඒ කරුණෙහි සිහි එළවාලීම පමණක් ම ප්‍රමාණ විය. ශික්ෂා පැනැවීමක් නැතිව මැ අවවාද මාත්‍රයෙන් ඒ ප්‍රථම බෝධියෙහි හික්ෂූහු හික්මුණාහ. ඒ එසේ මැ යි:

බුදුරදුන් විසින් නොයෙක් සූත්‍රාන්තයෙහි ''සො එවං පබ්බජිතො සමානො හික්ඛූනං සික්ඛා සාජීව සමාපන්නො පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො හොති'' යනාදීන් ප්‍රාණවධ විරමණාදි චූලසීල වශයෙන් ද, යළි ''බීජ

ගාම භූතගාමසමාරම්භා පටිවිරතො හොති'' යනාදීන් වදළ මධ්‍යම සීල වශයෙන් ද, එසේ ම ''යථා වා පනෙකෙ භොන්තො සමණබ්‍රාහ්මණා...... එවරූපාය තිරච්ඡාන විජ්ජාය මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙන්ති'' යනාදීන් වදරනලද මහාසීලයාගේ වශයෙන් ද, ඉන්ද්‍රියසංවර, සතිසම්පජඤ්ඤ, යථාලාභප්‍රත්‍යයසන්තොෂ ප්‍රභෙද වූ ශික්ෂාස්වරූපයෙන් වදළ විවිධ දහම් පෙදෙස් ඇත. ප්‍රථම බොධියෙහි භික්ෂූහු ප්‍රඥප්ති ශික්ෂාපද නැතිවැ මැ මෙබඳු සූත්‍ර ධර්මානුසරණයෙන් හික්මුණාහ. ''ආරාධයිංසු වත මෙ භික්ඛවෙ'' යනාදිය වදරන ලද්දේ මේ සඳහා යි. මෙබඳු සූත්‍රාන්තයන් දක්නා මෙකල ඇතැම් විචාරක කෙනකුන් 'විනය පිටකයෙහි තිබියැ යුතු කරුණු සූත්‍රවල ද මිශ්‍ර වී ඇතැ'යි මවිතය පළකරනු පමණක් නො වැ නුමුහුකුරාගිය බුද්ධි ඇති නවකයන් ගේ සන්තානයෙහි සංශය බීජ යනුදු වපුරාලනු දක්නට ලැබේ. ගතානුගතික විචාරකයන්ගෙන් ඈත්වන්නට සිතනු මැනවි.

## ප්‍රථම බෝධියෙන් පසු වැ:

''එව මෙව පනිධෙකච්චෙ මොඝපුරිසා මමඤ්ඤෙව අජ්ඣෙසන්ති, ධම්මෙ ච භාසිතෙ මමඤ්ඤෙව අනුබන්ධිතබ්බං මඤ්ඤන්ති: දෙසෙතු මෙ භන්තෙ භගවා සඞ්ඛිත්තෙන ධම්මං'' (අට්ඨකඞ්ගුත්තර.) ''මෙහි ඇතැම් මොඝපුරුෂ කෙනෙක් මා විසින් මෙසේ දහම් දෙසා ඇති කල්හිත් මා මැ අයැ ද සිටිති. වහන්ස මට සැකෙවින් දහම් දෙසනසේක්ව'යි මා මැ පසුපසැයායුතු කොට සිතත්' යයි වදරන ලද්දේ බුදුරදුන්ගේ චිත්තාරාධනය නො කළ භික්ෂූන් සඳහා නො වේ දැයි විමසියැ යුතු ය.

භික්ෂු සඞ්ඝයා කෙරෙහි රත්තඤ්ඤු මහත්ත්වාදි ආසවට්ඨානීය ධර්මයන් ගේ පහළවීම හෙතු කොටගෙන ශික්ෂා පැනවිය යුතු වස්තු උපන. භාග්‍යවතුන් වහන්සේ වෙරඤ්ජායෙහි වැස භික්ෂු සඞ්ඝයා සමග චාරිකා කෙරෙමින් බරණැසට ද එයින් විසාලාවට ද වැඩ මහාවන කූටාගාර සාලායෙහි විසූසේක. එකල්හි යැ කලන්‍දගම් වැසි සුදින්න කුලපුත් පැවිදි වූයේ. හේ එයින් අටවසකින් පසුව ස්වකීය ඥාති ග්‍රාමයට පැමිණියේ ය. එහි දී සුදින්න තෙරුන්ගේ මෛථුනපටිසෙවන වස්තුව නිමිති කොට පළමුවන පරිජිසික පද ය පනවා ලූහ. එ ද බුදුරදුන් ගේ පශ්චිම බොධියෙහි ය. මෙහෙණහට පන වන ලද අෂ්ටගරුධර්මයන් තබා විනයාගත හැම ශික්ෂාපදයක් ම උපන් වස්තුයෙහි පනවනලද වෙයි. උද්දෙශපරියාපන්න ශික්ෂාපදයෝ පශ්චිමබෝධියෙහි පනවන ලද්දාහුද වෙත්.

## ශික්ෂාපද:

පරිජි පචිති දෙපොත්හි සංග්‍රහ කරන ලද මහාක්ඛන්ධකයට අයත් ශික්ෂාපද දෙසියවිස්ස ද භික්ඛුනික්ඛන්ධකයෙහි ශික්ෂා පද තුන්සියසතර ද පක්ෂයක් පාසා උදෙසීමට පැමිණියාහු උද්දෙසපරියාපන්න ශික්ෂාපදයෝ යි. ඔහු මහාක්ඛන්ධකයෙහි ''එවං ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ''යි ද, භික්ඛුනීක්ඛන්ධකයෙහි ''එවං ච පන භික්ඛවෙ භික්ඛුනියො ඉමං සික්ඛාපදං උද්දිසන්තු''යි ද උදෙසිය යුතු සේ විධාන කොට ඇත. ''න භික්ඛවෙ මාතාපිතූහි අනනුඤ්ඤාතො පුත්තො පබ්බාජෙතබ්බො යො පබ්බාජෙය්‍ය ආපත්ති දුක්කටස්ස''යි ශික්ෂාස්වරූපයෙන් කරන ලද යම් නියමයෙක් ඇද්ද එය විනය පයඞාපන්න වුව ද උද්දෙසාගත නො වෙයි. ප්‍රඥප්තිකාලනියමය ද එහි නැත. විභඞ්ග ඛන්ධක ප්‍රභෙදය ද මෙහි ලා සැලැකිය යුතු ය. තවද බුදුරදුන් විනය ශික්ෂා පැනවීමෙහි දී දස අත්ථවසයක් දුටුසේක. එ ද විමසියයුතු ය.

දසඅත්ථවසය:

"තෙන හි භික්ඛවෙ භික්ඛූනං සික්ඛාපදං පඤ්ඤාපෙස්සාමි දස අත්ථවසෙ පටිච්ච"යි මහණෙනි දසඅත්ථවසයක් සඳහා භික්ෂූන්ට ශික්ෂාපද පනවමි, ශික්ෂාපද පැනැවීමෙහි ප්‍රයෝජන දසයක් වදාළ සේක. 1. සඞ්ඝයා ගේ සුට්ඨුභාවය පිණිස – හිත සුව පිණිස (සඞ්ඝසුට්ඨුතාය) යනු එකෙක. 2. සඞ්ඝයාගේ පහසුව පිණිස (සඞ්ඝඵාසුතාය) යනු එකෙක. 3. දුශ්ශිල පුද්ගල යනට නිග්‍රහ පිණිස (දුම්මඞ්කූනං පුග්ගලානං නිග්ගහාය) 4. ප්‍රියශීල මහණුනට පහසුවිහරණ පිණිස (පෙසලානං භික්ඛූනං ඵාසුවිහාරාය) 5. මෙලොව දී පැමිණෙන පරොපවාදදි ආශ්‍රවයන් දෙෂයන් දුරලීම පිණිස (දිට්ඨධම්මිකානං ආසවානං සංවරාය) 6. සම්පරායෙහි - පරලොවැ දී පැමිණෙන අපායාදි දුක් නැසීම පිණිස (සම්පරායිකානං ආසවානං පටිඝාතාය) 7. නො පහන් වූවන්ගේ ප්‍රසාදය පිණිස (අප්පසන්නානං පසාදය) 8. පහන් වූවන්ගේ ප්‍රසාදය වැඩීම පිණිස (පසන්නානං භිය්‍යොභාවාය) 9. ශාසනසද්ධර්මයාගේ චිරස්ථිතිය පිණිස (සද්ධම්මට්ඨිතියා) 10. විනයට අනුග්‍රහ පිණිස (විනයානුග්ගහාය) යන දසවැදෑරුම් අර්ථය සඳහා සියලු මැ ශික්ෂාපද පනවාලූ සේක.

තව ද විනයෙහි එන ශික්ෂාපද පිළිබඳ විවිධ විභාග මැනැවින් ඉගෙන ශික්ෂායෙහි ගෞරව ඇතිව සසුන්වන් සැදූහැති කුලපුත්‍රයන් විසින් ශාසනායු වර්ධනයට උත්සාහ කළයුතු ය.